# කන්‍යා මරියාවන්ගේ නිර්මල පිළිසිඳීමේ
## මංගලෝත්සවය

## පළමුවන දේව ප්‍රකාශනය උත්පත්ති 3:9-15, 20

*උත්පත්ති පොතෙන් උපුටා ගත් කොටසකි.*

තා සහ ස්ත්‍රිය අතරේද, තගේ වංශය හා ඇගේ වංශය අතරේද වෛරය තබන්නෙමි.

දෙවි සමිඳාණන් වහන්සේ මිනිසාට හඬ ගසමින් "නුඹ කොහේ දැ"යි ඇසූ සේක. "ඔබ වහන්සේගේ කටහඬ උයනේ මට ඇසිණි. එහෙත්, මා නග්න බැවින්, බිය වී සැඟවුණෙමි"යි ඔහු උත්තර දුන්නේ ය. එවිට උන් වහන්සේ, "ඔබ නග්න බව කීවේ කවරෙක් ද? මා නුඹට තහනම් කළ ගසින් නුඹ ගෙඩි කෑවෙහි දැ" යි ඇසූ සේක. ඔහුද, පිළිතුරු දෙමින්, "ඔබ මට සහකාරිය වශයෙන් දුන් ස්ත්‍රිය ඒ ගසේ ගෙඩි කඩා මට දුන්නා ය, මමත් කෑවෙමි" යි පැවසී ය. එවිට දෙවි සමිඳාණන් වහන්සේ ස්ත්‍රියට කතා කොට, "නුඹ මෙය කෙළේ මන්දැ"යි ඇසූ සේක. "සර්පයා මා රැවටී ය, මමත් කෑවෙමි" යි ඈ පිළිතුරු දුන්නා ය.

එවිට දෙවි සමිඳාණන් වහන්සේ සර්පයාට කතා කොට මෙසේ වදාළ සේක:

"තා මෙය කළ බැවින් සියලු ගවමහීෂයන්ට ද වනයේ සියලු මෘගයන්ට ද වඩා තෝ ශාප ලද්දෙක් වේ වා! දිවි ඇති තාක් උර ගා යමින් තෝ දූවිලි කන්නෙහි ය. තා සහ ස්ත්‍රිය අතර ද තගේ වංශය සහා ඇගේ වංශය අතර ද බද්ධ වෛරය තබන්නෙමි. ඔහු තගේ හිස පොඩි කරන්නේ ය: තෝ ද ඔහුගේ විලුඹ දෂ්ට කරන්නෙහි ය." මිනිසා සිය බිරිඳට 'ඒව' යන නම දුන්නේ ය. මන්ද, ඈ ජීවමාන සියල්ලන්ගේ මාතාව බැවිනි. දෙවි සමිඳාණන් වහන්සේ හම් වස්ත්‍ර සාදා ආදම්ට සහ ඔහුගේ භාර්යාවට හැඳවූ සේක.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 98:1–4

පිළිතුර: සමිඳුන් හට නව ගීයක් ගයන්න.

ගීය : සමිඳුන්ට නව ගීයක් ගයන්න:
මන්ද,එතුමාණෝ අසිරිමත් ක්‍රියා කළ සේක.
සිය බලයෙන් හා ශුද්ධ ශක්තියෙන් ජයග්‍රහණය ලත් සේක.
සමිඳාණෝ ස්වකීය ජයග්‍රහණය ප්‍රකාශ කළ සේක:

විජාතීන්ගේ ඇස් හමුයෙහි සිය විමුක්ති බලය එළිදරව් කළ සේක.
එතුමාණෝ ඉශ්රායෙල් වංශය කෙරෙහි
එතුමන්ගේ ප්‍රේමයත්, විශ්වාසවන්තකමත් සිහි කළ සේක.

මිහි පිට සියලු දෙන අප දෙවිඳුන්ගේ ජයග්‍රහණය දුටුවෝ ය.
එම්බා ලෝ වැසි සියල්ලෙනි, සමිඳුන් හට ප්‍රීතියෙන් ගී ගයන්න:
ප්‍රීති ගී ගයමින් එතුමන් පසසන්න.

## දෙවන දේව ප්‍රකාශනය එපේසි 1:3–6, 11–12

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් එපේසිවරුන්ට ලියන ලද හසුනෙන් උපුටා ගත් කොටසකි.*

දෙවියන් වහන්සේ ලෝකය මැවීමට පෙර ක්‍රිස්තුස් වහන්සේ තුළ
අප තෝරා ගත් සේක.

ක්‍රිස්තුන් වහන්සේ තුළින් ස්වර්ගීය ස්ථනවල සියලු අධ්‍යාත්මික ආශීර්වාද අපට දෙවා වදාළ, අපගේ ස්වාමීන් වන, ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ පියාණන් වූ දෙවියන් වහන්සේට ප්‍රශංසා වේ වා! ප්‍රේමයෙන් උන් වහන්සේගේ ඉදිරියෙහි අප ශුද්ධ ව නොකැළැල් ව සිටින පිණිස, ලෝකය මැවීමට ප්‍රථමයෙන් ක්‍රිස්තුන් වහන්සේ තුළ දෙවියන් වහන්සේ අප තෝරාගත් සේක. තවද ස්වකීය ප්‍රසාදය හා අරමුණ අනුව, ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කරණකොටගෙන, උන් වහන්සේ, අප දරුකමට පිළිගන්න පිණිස, දෙවියන් වහන්සේ පෙර නියම කළ සේක. උන් වහන්සේ එසේ කළේ තමන් වහන්සේගේ ප්‍රේමයාණන් වහන්සේ තුළ අපට දෙව වරප්‍රසාදය අනුව ලබාදුන් මහිමාන්විත කරුණාව ප්‍රශංසාව සඳහා ය. අපි මෙම ක්‍රිස්තුන් වහන්සේ

තුළින් තෝරාගත් සෙනගක් වෙමු. එසේ වන්නේ, දෙවියන් වහන්සේ පෙර නියම කරගත් සැලැස්ම ලෙස, සියල්ල සිදු කරන ස්වකීය අභිප්‍රාය අනුව ය. මෙසේ වූයේ ක්‍රිස්තුන් වහන්සේ තුළින් ප්‍රථමයෙන් බලාපොරොත්තු ලැබූ අප, උන් වහන්සේගේ මහිමයේ ප්‍රශංසාව සඳහා සිටින පිණිස ය.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද ලූක් 1:28, 42

ආලේලූයා! ආලේලූයා!
“විපුල ප්‍රසාදලත් උත්තමිය, ඔබට මංගල වේ:
සමිඳාණන් වහන්සේ ඔබ සමඟ ය.
ඔබ වනිතාවන් අතර අතිශයින් ආශිර්වාද ලද්දී ය.”
ආලේලූයා!

## සුවිශේෂය ලූක් 1:26–38

*සුවිශේෂක ලූක් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

“නමෝ, ප්‍රියප්‍රසාද පූර්ණවන්තියනි! ස්වාමීන් වහන්සේ ඔබ සමඟය.”

සවැනි මස, ගාබ්‍රියෙල් නම් දේව දූතයා දෙවියන් වහන්සේ විසින් ගලීලයේ නාසරෙත් නම් නුවර විසූ, දාවිත් රජ පරපුරෙන් පැවත එන ජෝසෙප් නම් මනුෂ්‍යයෙකු හට විවාහ ගිවිසුම් දී සිටි කන්‍යාවක වෙත යවන ලදී. ඒ කන්‍යාවගේ නම මරියා ය. දේව දූතයා ඈ සිටි තැනට පැමිණ, “විපුල ප්‍රසාදලත් උත්තමිය, ඔබට මංගල වේ: සමිඳාණන් වහන්සේ ඔබ සමඟ ය”යි කී ය. එහෙත්, ඈ ඒ වදන් අසා අතිශයින් කැළඹී මේ කෙබඳු ආචාරයක් දැ යි සිත සිතා සිටියා ය. දේව දූතයා ඈට කතා කොට, “මරියාණනි, බිය නොවන්න, ඔබ දෙවියන් වහන්සේගෙන් වරප්‍රසාද ය ලද්දෙහි ය. මේ බලන්න, ඔබ පිළිසිඳගෙන පුතෙකු ලබන්නෙහි ය. උන් වහන්සේ ට ‘ජේසුස්’ යන නාමය තබන්න.

උන් වහන්සේ, ශ්‍රේෂ්ඨ වන සේක, පරමෝත්තමයාණන්ගේ පුත්‍රයාණෝ යයි කියනු ලබන සේක: උන් වහන්සේගේ පිය වූ දාවිත්ගේ සිංහාසනය දෙවි ස්වාමින් වහන්සේ උන් වහන්සේට ප්‍රදානය කරන සේක: උන් වහන්සේ ජාකොබ්ගේ වංශය කෙරෙහි සදහට ම රජකම් කරන සේක: උන් වහන්සේගේ රාජ්‍යය කෙළවරක් නොදක්නේ ය"යි කී ය.

එවිට මරිය තුමී දේව දූතයාට කතා කොට, "මට පුරුෂයෙකු නැති බැවින් මෙවැන්නක් කෙසේ විය හැකි දැ" යි ඇසුවා ය. දේව දූතයා ඇට උත්තර දෙමින්, "ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ කෙරෙහි පහළ වන සේක: පරමෝත්තමයාණන්ගේ ආනුභාවය ද ඔබ වසාගන්නේ ය. එහෙයින් උපදින පරිශුද්ධ දරුවා 'දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ ය' යි කියනු ලබන සේක. බලන්න, ඔබේ ඥාතිවරිය වන එලිසබෙත් ඇගේ මහලු වයසේ දී පුතෙකු පිළිසිඳගත්තා ය. වඳ යයි කී ඇයට දැන් සවැනි මාසය ය. මක්නිසා ද, දෙවියන් වහන්සේට නොකළ හැකි කිසිවක් නැතැ"යි කීවේ ය. මරිය තුමී කතා කරමින්, "බලන්න, මම සමිඳාණන් වහන්සේගේ දාසිය වෙමි: ඔබ පැවසූ ලෙස ම මට ඉටු වේ වා"යි කීවා ය. එවිට දේව දූතයා ඇ කෙරෙන් වෙන් ව ගියේ ය.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*